96031

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II | පැය තුනයි |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| Business and Accounting Studies | I, II | Three hours |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

● පහත සඳහන් සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"නිර්මලා තමා විසින් ම සෞඛ්‍ය ආරක්ෂිත ලෙස සකස් කරනු ලබන ඉඳිආප්ප, පිට්ටු, රොටී, කඩල, මුං ඇට, ආප්ප සහ බත් උදෑසන ආහාර ලෙස ඇයගේ ම ව්‍යාපාරයේ තබා අලෙවි කරයි."

1. මෙම ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) ආහාර (2) ඇඳුම් (3) නිවාස (4) සෞඛ්‍යය

2. මෙම ව්‍යාපාරය විසින් සපයනු ලබන ඉඳිආප්ප, පිට්ටු, රොටී, කඩල, මුං ඇට, ආප්ප සහ බත් යනාදිය හඳුන්වනුයේ,
(1) අවශ්‍යතා ලෙස ය. (2) නිෂ්පාදිත ලෙස ය. (3) යෙදවුම් ලෙස ය. (4) ප්‍රාග්ධනය ලෙස ය.

3. ඉහත සිද්ධිය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - මෙම ව්‍යාපාරය විවිධ මිනිස් වුවමනා නිර්මාණය කරයි.
B - නිර්මලා සෘජු නිෂ්පාදනයේ යෙදෙයි.
C - මෙය පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
D - මෙම ව්‍යාපාරය ප්‍රාථමික නිෂ්පාදනයේ යෙදෙයි.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) B හා D ය.

4. සේවක කුසලතා සංවර්ධනය සඳහා ව්‍යාපාරය විසින් පැවැත් වූ වැඩමුළුව එහි සියලු සේවකයින් සාර්ථක ව නිම කිරීම එම ව්‍යාපාරයට,
(1) ශක්තියකි. (2) අවස්ථාවකි. (3) දුර්වලතාවකි. (4) තර්ජනයකි.

5. පහත X තීරුවේ ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් ද, Y තීරුවේ ඒවාට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. තනිවල ස්වාමි ව්‍යාපාර | A - ගුණරත්න සහ සහෝදරයෝ |
| 2. හවුල් ව්‍යාපාර | B - ඇල්ෆා පීඑල්සී |
| 3. සී/ස පෞද්ගලික සමාගම් | C - කුමාර වෙළෙඳසැල |
| 4. සී/ස පොදු සමාගම් | D - සී/ස මොරාසු (පෞද්.) සමාගම |

X තීරුවේ සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ග, Y තීරුවේ සඳහන් නිදසුන් සමඟ අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ
(1) A, B, C, D ය. (2) A, C, D, B ය. (3) C, A, B, D ය. (4) C, A, D, B ය.

6. මහ බැංකු වාර්තාවට අනුව 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයට වැඩි ම දායකත්වයක් ලබා දී ඇත්තේ,
(1) කෘෂිකාර්මික නිෂ්පාදන අංශයෙනි. (2) කාර්මික නිෂ්පාදන අංශයෙනි.
(3) සේවා නිෂ්පාදන අංශයෙනි. (4) ප්‍රාථමික නිෂ්පාදන අංශයෙනි.

7. ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරන සියලු ම ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(2) සී/ස සමාගමක් සංස්ථාපනය කිරීම මගින් එය ලැයිස්තුගත සමාගමක් බවට පත් වේ.
(3) සෑම ව්‍යාපාරයකට ම ලියාපදිංචි කිරීම මගින් නීතිමය පුද්ගලභාවයක් හිමි වේ.
(4) සී/ස සමාගමක් සංස්ථාපනය කිරීම මගින් නීතිමය පුද්ගලභාවයක් හිමි වේ.

● පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **8** සිට **10** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මොහාන් විසින් ආරම්භ කිරීමට අපේක්ෂිත පැන්සල් නිෂ්පාදන ව්‍යාපාරයේ 2015 ජනවාරි මාසය සඳහා ඇස්තමේන්තුගත තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| A - අපේක්ෂිත විකුණුම් - පැන්සල් | 500 | |
| B - පැන්සලක නිෂ්පාදන පිරිවැය | රු. | 10 |
| C - පැන්සලක විකුණුම් මිල | රු. | 15 |
| D - අපේක්ෂිත ආරම්භක ප්‍රාග්ධනය | රු. | 25 000 |
| E - අපේක්ෂිත බැංකු ණය | රු. | 10 000 |

8. ඉහත තොරතුරුවලින් මෙම ව්‍යාපාරයේ අලෙවි සැලැස්මේ ඇතුළත් කරන අයිතම වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) B හා D ය.

[ දෙවැනි පිටුව බලන්න.

9. මෙම ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය වන්නේ,
(1) රු. 2 500 කි. (2) රු. 5 000 කි. (3) රු. 7 500 කි. (4) රු. 12 500 කි.

10. මොහාන් ලබා ගැනීමට අපේක්ෂිත බැංකු ණය මුදල ව්‍යාපාර සැලැස්මෙහි ඇතුළත් කරනුයේ,
(1) අලෙවි සැලැස්මෙහි ය. (2) මෙහෙයුම් සැලැස්මෙහි ය.
(3) මූල්‍ය සැලැස්මෙහි ය. (4) මානව සම්පත් සැලැස්මෙහි ය.

11. චෙක්පතක් රේඛනය කිරීම හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම විශේෂ රේඛනය වේ.
(2) චෙක්පතක් රේඛනය කළ හැක්කේ චෙක්පතේ අණකරුට පමණි.
(3) රේඛිත චෙක්පතක් ලබා ගන්නා පුද්ගලයාට එය පවරනු ලබන පුද්ගලයාට වඩා වැඩි හිමිකමක් ලැබේ.
(4) රේඛනය කළ චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත නොහැකි ය.

12. සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යනු ලබන ධනංජයට බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා ඔහු තෝරාගත යුතු බැංකුව වන්නේ,
(1) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවයි. (2) ලංකා බැංකුවයි.
(3) ජාතික ඉතිරි කිරීමේ බැංකුවයි. (4) ජාතික සංවර්ධන බැංකුවයි.

13. ගනුදෙනුකරුවකුට ණය පදනම මත බැංකුවක් විසින් නිකුත් කරනු ලබන විද්‍යුත් කාඩ්පත වනුයේ,
(1) ණය කාඩ්පත ය. (Credit Card) (2) හර කාඩ්පත ය. (Debit Card)
(3) ස්වයංක්‍රිය ටෙලර් කාඩ්පත ය. (ATM Card) (4) පෙර ගෙවුම් කාඩ්පත ය. (Prepaid Card)

- පහත සිද්ධිය ඇසුරෙන් අංක **14** හා **15** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කුමාරසිරි සිය වෙළෙඳ ව්‍යාපාරයට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ගිනි රක්ෂණ ඔප්පුවක් ලබා ගන්නා ලදී. පසුව සී/ස ලිට්රෝ ගෑස් සමාගමේ නියෝජිතයකු ලෙස ගෑස් බෙදා හැරීමේ කටයුතු එම ව්‍යාපාර ස්ථානයේ ම ආරම්භ කරන ලදී. නමුත් ඒ බව රක්ෂණ සමාගමට දැනුම් දී නොතිබුණි. ගෑස් කාන්දුවකින් ව්‍යාපාරයේ ගින්නක් හටගත් අතර ඉන් ඇති වූ අලාභය සඳහා වන්දි ඉල්ලූ විට රක්ෂණ සමාගම එය ප්‍රතික්ෂේප කරන ලදී.

14. මෙහි සඳහන් රක්ෂකයා හා රක්ෂිතයා පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) කුමාරසිරි හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (2) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා කුමාරසිරි
(3) සී/ස ලිට්රෝ ගෑස් සමාගම හා කුමාරසිරි (4) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සී/ස ලිට්රෝ ගෑස් සමාගම

15. රක්ෂණ සමාගම විසින් වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බල පෑ රක්ෂණ මූලධර්මය කුමක් ද?
(1) රක්ෂ්‍ය හිමිකම (2) උපරිම විශ්වාසය (3) හානිපූරණය (4) ආදේශනය

16. ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ සිදු වූ සිද්ධීන් කිහිපයක් පහත X තීරුවේ ද, ප්‍රවාහන මූලිකාංග Y තීරුවේ ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. සුඛෝපභෝගී බස් රථ 100 ක් ශ්‍රී ලං.ග.ම. මගින් ධාවනයට යෙදවීම | A - මාර්ගය |
| 2. ඩීසල්, පෙට්‍රල් හා භූමිතෙල්වල මිල පහළ දැමීම | B - මාධ්‍යය |
| 3. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විවෘත කිරීම | C - බලය |
| 4. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය විවෘත කිරීම | D - පර්යන්තය |

ඉහත X තීරුවේ සඳහන් සිද්ධි Y තීරුවේ සඳහන් ප්‍රවාහන මූලිකාංග සමග නිවැරදි ව අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) A, B, C, D (2) B, C, A, D (3) B, C, D, A (4) C, B, D, A

17. ව්‍යාපාරයක් නව භාණ්ඩයක් හඳුන්වාදීමේ වෙළෙඳ දැන්වීම අන්තර්ජාලයේ පළ කරන ලදී. මෙය,
(1) අභ්‍යන්තර, වාචික, විද්‍යුත් සන්නිවේදනයකි. (2) අභ්‍යන්තර, ලිඛිත, විද්‍යුත් සන්නිවේදනයකි.
(3) බාහිර, වාචික, විද්‍යුත් සන්නිවේදනයකි. (4) බාහිර, ලිඛිත, විද්‍යුත් සන්නිවේදනයකි.

18. පාසලක් ඉදිරිපිට මහාමාර්ගයේ පහත පුවරුව සවිකර තිබුණි. මෙය අයත් වන්නේ,



(1) ලිඛිත සන්නිවේදනයට ය.
(2) වාචික සන්නිවේදනයට ය.
(3) විද්‍යුත් සන්නිවේදනයට ය.
(4) සංකේත හා සංඥා සන්නිවේදනයට ය.

19. සී/ස සමාගමක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ආයෝජකයකුට ලැබිය **නොහැකි** ප්‍රතිලාභය වන්නේ,
(1) පොලී ආදායම් ලැබීම ය. (2) ප්‍රාග්ධන ලාභ ලැබීම ය.
(3) ලාභාංශ ලැබීම ය. (4) ඡන්ද බලය හිමි වීම ය.

20. අමා සහ පබා රෙදිපිළි ව්‍යාපාරයේ නව කර්මාන්තශාලාව ඉදිකිරීමට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීම සඳහා යොදා ගත හැකි මූල්‍ය සම්පාදන මාර්ගය කුමක් ද?
(1) සාමාන්‍ය කොටස් නිකුත් කිරීම (2) වරණීය කොටස් නිකුත් කිරීම
(3) ණයකර නිකුත් කිරීම (4) බැංකු ණය ලබා ගැනීම

/ තුන්වැනි පිටුව බලන්න.

21. ලෙජර් ගිණුම් දෙකක් පහත X තීරුවේ ද, එම ගිණුම්වල ගනුදෙනු සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන් මූලධර්මය පහත Y තීරුවේ ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ගෙවල් කුලී ගිණුම | A - වගකීම් - වැඩිවීම බැර, අඩුවීම හර |
| 2. ණයහිමි ගිණුම | B - වගකීම් - වැඩිවීම හර, අඩුවීම බැර |
| | C - වියදම් - වැඩිවීම බැර, අඩුවීම හර |
| | D - වියදම් - වැඩිවීම හර, අඩුවීම බැර |

X තීරුවේ සඳහන් ලෙජර් ගිණුම් Y තීරුවේ සඳහන් ද්විත්ව සටහන් මූලධර්ම සමඟ නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) C, A (2) C, B (3) D, A (4) D, B

22. ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| වත්කම් | = | අයිතිකරුගේ හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| + 25 000 | = | – | | + 25 000 |

ඉහත සමීකරණයේ සටහන් කර ඇති ගනුදෙනුව වන්නේ,

(1) රු. 25 000 ක බඩු තොගයක් ණයට ගැනීම. (2) ණයහිමියන්ට රු. 25 000 ක් ගෙවීම.
(3) බැංකු ණය මුදලින් රු. 25 000 ක් ආපසු ගෙවීම. (4) අයිතිකරු මුදලින් රු. 25 000 ක් ප්‍රාග්ධනය යෙදවීම.

23. පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.

- රු. 10 000 ක බඩු තොගයක් නිමල්ට ණයට විකිණීම

මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) මුදල් ගිණුම හර රු. 10 000
විකුණුම් ගිණුම බැර රු. 10 000

(2) විකුණුම් ගිණුම හර රු. 10 000
නිමල්ගේ ගිණුම බැර රු. 10 000

(3) නිමල්ගේ ගිණුම හර රු. 10 000
විකුණුම් ගිණුම බැර රු. 10 000

(4) මුදල් ගිණුම හර රු. 10 000
නිමල්ගේ ගිණුම බැර රු. 10 000

24. 2014.01.31 දිනට ව්‍යාපාරයේ මුදල් පොතට අනුව බැංකු ශේෂය රු. 19 200 ක් වූ අතර, එදිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය රු. 20 000 ක් විය. මෙම ශේෂයන්ගේ වෙනසට හේතු වන ගනුදෙනුව වන්නේ,

(1) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 800 කි.
(2) මුදල් පොතේ සටහන් නොවූ, බැංකුව අය කළ ගාස්තු රු. 800 කි.
(3) බැංකුව වැරදීමකින් බැංකු ප්‍රකාශනයට හර කර ඇති වටිනාකම රු. 800 කි.
(4) ව්‍යාපාරය වැරදීමකින් මුදල් පොතේ බැංකු තීරුවට බැර කර ඇති වටිනාකම රු. 800 කි.

25. මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීමේ දී උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය කුමක් ද?

(1) චෙක්පතේ පිළිපත (2) බැංකු සැසඳුම් ප්‍රකාශය (3) බැංකු ප්‍රකාශනය (4) චෙක්පත් තැන්පතු පත

26. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.

- කපිලට රු. 5 000 ක බඩු තොගයක් ආපසු යැවීම.

ඉහත ගනුදෙනුව සටහන් කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර ලේඛනය හා මූලික පොත පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) හරපත හා ආපසු එවුම් ජ'නලය (2) හරපත හා ආපසු යැවුම් ජ'නලය
(3) බැරපත හා ආපසු එවුම් ජ'නලය (4) බැරපත හා ආපසු යැවුම් ජ'නලය

27. පොදු ජ'නලය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පොදු ජ'නලය උපයෝගී පොතකි.
B - පොදු ජ'නලයේ සටහන් කරනුයේ ආරම්භක සටහන් පමණි.
C - පොදු ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛනය ජ'නල වවුචරයයි.
D - ගිණුම්කරණයේ දී සිදුවන වැරදි නිවැරදි කිරීමේ සටහන් තබනුයේ පොදු ජ'නලයේ ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) A හා C පමණි. (2) A හා D පමණි. (3) A, C හා D පමණි. (4) B, C හා D පමණි.

28. අමිලගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම රු. 3 000 ක් විය. 2014.09.30 දිනට සුළු මුදල් භාරකරු සතු ව තිබූ මුදල රු. 150 ක් වූ අතර එදින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී.
සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

(1) සුළු මුදල් පොත හර රු. 3 000
මුදල් පොත බැර රු. 3 000

(2) සුළු මුදල් පොත හර රු. 2 850
මුදල් පොත බැර රු. 2 850

(3) මුදල් පොත හර රු. 3 000
සුළු මුදල් පොත බැර රු. 3 000

(4) මුදල් පොත හර රු. 2 850
සුළු මුදල් පොත බැර රු. 2 850

29. වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක් පහත දැක්වේ.

- ණයහිමියකු වූ කාංචනාට ගෙවිය යුතු රු. 5 000 ක මුදල පියවීම සඳහා රු. 4 500 ක චෙක්පතක් නිකුත් කරන ලදී.

මෙම ගනුදෙනුව නිසා,

(1) ව්‍යාපාරයේ දුන් වට්ටම් රු. 500 කින් වැඩි වේ. (2) ව්‍යාපාරයේ ණයහිමියෝ රු. 4 500 කින් අඩු වේ.
(3) ව්‍යාපාරයේ බැංකු ශේෂය රු. 4 500 කින් අඩු වේ. (4) ව්‍යාපාරයේ මුදල් ශේෂය රු. 500 කින් වැඩි වේ.

30. ව්‍යාපාරයේ මුදල් පොතේ බැංකු තීරුවේ බැර ශේෂය එම ව්‍යාපාරයේ,

(1) වත්කමකි. (2) වගකීමකි. (3) ආදායමකි. (4) වියදමකි.

/ හතරවැනි පිටුව බලන්න.

31. මෝටර් රථ අලුත්වැඩියා වියදම වූ රු. 100 000 ක් මෝටර් රථ ගිණුමට හර කර ඇත. මෙය,
(1) ඌනතා දෝෂයකි. (2) අතිරික්තතා දෝෂයකි. (3) මූලධර්ම දෝෂයකි. (4) ද්විකරණ දෝෂයකි.

32. ගිණුම්කරණයේ දී සිදු වූ වැරදි කිහිපයක් පහත දැක්වේ.
A - ආපසු යැවුම් රු. 1 200 ආපසු යැවුම් ජ'නලයේ රු. 2 100 ක් ලෙස සටහන් කර තිබීම.
B - ආපසු එවුම් රු. 3 000 ආපසු එවුම් ගිණුමට මෙන් ම ණයගැති ගිණුමට ද හර කර තිබීම.
C - ලද ආයෝජන ආදායම් රු. 1 500 මුදල් පොතේ පමණක් සටහන් කර තිබීම.
ඉහත වැරදි අතුරෙන්, ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව අතර වෙනසක් ඇති කරන වැරදි වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය.
(3) B හා C ය. (4) A, B හා C යන සියල්ල ම ය.

33. සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයකට රු. 800 000 ක් වටිනා ලොරි රථයක් මිල දී ගැනීම ......①...... ක් වන අතර, ව්‍යාපාරයේ ගබඩාව අලුත්වැඩියා කිරීමේ වියදම වූ රු. 200 000 ......②...... ක් වේ.
ඉහත ප්‍රකාශයේ අංක ① හා ② යන ස්ථානවලට අදාළ පදයුම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ප්‍රාග්ධන වියදම, අයභාර වියදම (2) අයභාර වියදම, ප්‍රාග්ධන වියදම
(3) මෙහෙයුම් වියදම, ප්‍රාග්ධන වියදම (4) මෙහෙයුම් වියදම, අයභාර වියදම

34. එකමුතු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 150 කි. මාසික සාමාජික ගාස්තුව රු. 50 ක් වන අතර සාමාජිකයින් 20 දෙනෙකු 2013 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නොමැත. මෙම ක්‍රීඩා සමාජයේ 2013 වර්ෂය අවසානයේ පිළියෙල කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුමේ සටහන් කරන සාමාජික මුදල වනුයේ,
(1) රු. 6 500 කි. (2) රු. 7 500 කි. (3) රු. 78 000 කි. (4) රු. 90 000 කි.

35. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක ආදායම් හා වියදම් ගිණුම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පරිත්‍යාග ලැබීම් ආදායම් හා වියදම් ගිණුමේ හර පැත්තේ සටහන් කරයි.
(2) සියලු ම මුදල් ලැබීම් හා ගෙවීම් ආදායම් හා වියදම් ගිණුමේ සටහන් කරයි.
(3) කාලච්ඡේදය තුළ මුදලින් ලද සාමාජික මුදල පමණක් ආදායම් හා වියදම් ගිණුමේ සටහන් කරයි.
(4) ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය අතිරික්තය හෝ ඌනතාව ලෙස හඳුන්වයි.

● පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නන්දාගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2013.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| තොගය (2013.01.01 දිනට) | 20 000 | |
| ගැනුම් | 200 000 | |
| විකුණුම් | | 343 000 |
| බෙදාහැරීමේ වෑන් රථය (පිරිවැයට) | 500 000 | |
| බෙදාහැරීමේ වෑන් රථය ක්ෂය වෙන්කිරීම (2013.01.01 දිනට) | | 100 000 |
| ගෙන ඒමේ කුලී | 9 000 | |
| දුන් වට්ටම් | 1 200 | |
| ගෙන යාමේ කුලී | 14 000 | |
| ගොඩනැගිලි කුලී | 24 000 | |
| 10% බැංකු ණය | | 100 000 |
| විදුලි ගාස්තු | 12 500 | |
| පරිපාලන වේතන | 25 000 | |
| බැංකු අයිරාව | | 12 700 |
| ප්‍රාග්ධනය | | 250 000 |
| | 805 700 | 805 700 |

අමතර තොරතුරු :
1. 2013.12.31 දිනට තොගය රු. 30 000 කි.
2. බෙදාහැරීමේ වෑන් රථය සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 10% බැගින් ක්ෂය කළ යුතු ය.

36. මෙම ව්‍යාපාරයේ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,
(1) රු. 179 000 කි. (2) රු. 190 000 කි. (3) රු. 199 000 කි. (4) රු. 229 000 කි.

37. මෙම ව්‍යාපාරයේ ජංගම වගකීමක් වන්නේ,
(1) බැංකු අයිරාව ය. (2) බැංකු ණය ය.
(3) බෙදාහැරීමේ රථ ක්ෂය වෙන් කිරීම ය. (4) ප්‍රාග්ධනය ය.

38. මෙම ව්‍යාපාරයේ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දැක්වෙන මූල්‍ය හා වෙනත් වියදම්වල එකතුව වනුයේ,
(1) රු. 1 200 කි. (2) රු. 10 000 කි. (3) රු. 11 200 කි. (4) රු. 22 700 කි.

39. මෙම ව්‍යාපාරයේ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දැක්වෙන බෙදාහැරීමේ රථ ක්ෂය වටිනාකම වනුයේ,
(1) රු. 50 000 කි. (2) රු. 100 000 කි. (3) රු. 150 000 කි. (4) රු. 550 000 කි.

40. මෙම ව්‍යාපාරයේ 2013.12.31 දිනට ජංගම නොවන වත්කම්වල ශුද්ධ අගය වනුයේ,
(1) රු. 50 000 කි. (2) රු. 350 000 කි. (3) රු. 400 000 කි. (4) රු. 500 000 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය **I, II**
வணிகக் கல்வியும் கணக்கீடும் **I, II**
Business and Accounting Studies **I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද, II** කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද,** බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **(i)** සිට **(x)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ උපාධිධාරියකු වන හරිත සහ ඔහුගේ සහෝදරිය වන ලතා විසින් 2014.01.01 දින රු. 10 000 බැගින් ප්‍රාග්ධනය යොදවා "හරිතලතා හෙළ ඔසු" නමින් කොළ කැඳ හා ඖෂධීය පාන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් රජයේ ආයුර්වේද රෝහලක් අසල කුලියට ගත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලදී. එදින ම රු. 24 000 ක් වටිනා උපකරණ ණයට ගන්නා ලදී.
ආයුර්වේද රෝහලේ සතියේ සෑම දිනක ම සායන පැවැත්වෙන අතර, එහි දී වෛද්‍යවරු විසින් ඖෂධීය ආහාර පානවල ඇති වටිනාකම පිළිබඳ ව රෝගීන් දැනුවත් කිරීම ද සිදු කරයි.

2014 ජනවාරි මාසය තුළ පහත ගනුදෙනු සිදු විය.

| | | |
|---|---|---|
| * අත්පිට ගැනුම් - ඖෂධීය කොළ වර්ග | රු. | 25 000 |
| * අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීම් | රු. | 10 000 |
| * මාසික විදුලි බිල ගෙවීම | රු. | 3 000 |
| * මාසික ගොඩනැගිලි කුලී ගෙවීම | රු. | 5 000 |
| * අත් උදව්කරුට ගෙවූ මාසික වැටුප | රු. | 10 000 |

ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා රු. 20 000 ක බැංකු ණයක් 2014.01.31 දින සණස සංවර්ධන බැංකුවෙන් 5% ක වාර්ෂික පොලියකට ලබා ගන්නා ලදී. උපකරණවල ඵලදායී ජීවිත කාලය වර්ෂ දෙකකි. 2014.01.31 දිනට ඉතිරි තොග කිසිවක් නොවී ය.

(i) ඉහත සිද්ධියේ සඳහන් වන,
   (අ) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියන්න.
   (ආ) රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලියන්න.

(ii) හරිතලතා හෙළ ඔසු ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න.

(iii) "හරිතලතා හෙළ ඔසු ව්‍යාපාරය හරිත සහ ලතා විසින් පවත්වාගෙන යන බැවින් එහි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ."
   (අ) මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද?
   (ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iv) හරිතලතා හෙළ ඔසු ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් සඳහන් කරන්න.

(v) මෙම ව්‍යාපාරයේ කොළ කැඳ නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ යෙදවුම්, ක්‍රියාවලිය හා නිමැවුම් මොනවාද යන්න ඒ ඒ ශීර්ෂ යටතේ දක්වන්න.

(vi) (අ) මෙම ව්‍යාපාරයේ පිළියෙල කළ යුතු මූලික පොත් **දෙකක්** සඳහන් කරන්න.
   (ආ) 2014.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මුළු වත්කම්වල වටිනාකම කොපමණ ද?

(vii) 2014.01.31 දින ලබා ගත් බැංකු ණය මුදල සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(viii) (අ) 2014.01.01 දිනට ප්‍රාග්ධනය කොපමණ ද?
   (ආ) 2014.01.31 දිනට මුළු වගකීම්වල වටිනාකම කොපමණ ද?

(ix) 2014.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරන ලාභාලාභ ගිණුමේ දැක්වෙන උපකරණ ක්ෂය වටිනාකම කොපමණ ද?

(x) මෙම ව්‍යාපාරයේ 2014.01.31 දිනට මුදල් ශේෂය රු. 47 000 කි. ව්‍යාපාරයේ සියලු ම විකුණුම් අත්පිට මුදලට සිදු කරන ලද්දේ නම්, 2014 ජනවාරි මාසයේ විකුණුම් වටිනාකම ගණනය කරන්න.

(ලකුණු $02 \times 10 = 20$ යි)

/හයවැනි පිටුව බලන්න.

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) සෘජු නිෂ්පාදනය හා වක්‍ර නිෂ්පාදනය යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) පාසල් ශිෂ්‍යයකුගේ අවශ්‍යතා **දෙකක්** ලියන්න.

(ආ) ඉහත (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් අවශ්‍යතාව සපුරා ගන්නා ආකාරය ලියන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයෝ සහ තරගකරුවෝ ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක වේ.

(ආ) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ එක ම අරමුණ වන්නේ බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීම ය.

(ඉ) ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන පුද්ගලයකු ප්‍රථමයෙන් ම කළ යුත්තේ ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම ය.

(ඊ) යම් නිශ්චිත කාලයක් තුළ දී ව්‍යාපාරයක සිදු වූ මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් ඇතුළත් කරනුයේ මූල්‍ය සැලැස්ම තුළ ය. (ලකුණු 02 යි)

(iv) (අ) විදේශ රැකියා නියෝජිත ආයතනයක් ආරම්භ කිරීමට අදහස් කරන්නකු ඒ සඳහා අවශ්‍ය බලපත්‍රය ලබා ගත යුත්තේ කුමන ආයතනයකින් ද?

(ආ) ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් අත් කර ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) ඉඳුනිල් ළමා ඇඳුම් මසා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ඒ සඳහා ඇය කුලියට ගත් කඩ කාමරයක් යොදා ගැනීමට හා මහන මැෂිමක් ණයට ලබා ගැනීමට ද අපේක්ෂා කරයි. තව ද සහයකයකු බඳවා ගැනීමට ද අදහස් කරයි.

(අ) මෙම ව්‍යාපාරයේ සෘජු පිරිවැයක් ලියන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ වක්‍ර පිරිවැයක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

3. (i) බැංකු අයිරාවක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) (අ) ව්‍යාපාරයට ණයකාඩ්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම ලබා ගැනීම මගින්, ව්‍යාපාරිකයකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(ආ) චෙක්පතක් සම්බන්ධයෙන් සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය අතර වෙනස දක්වන්න. (ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක දේපලවලට සම්බන්ධ අවදානම් ආවරණය කිරීම ආරක්ෂණය වේ.

(ආ) රක්ෂණයේ අරමුණ වන්නේ අවදානම අවම කිරීම ය.

(ඉ) නිෂ්පාදන කළමනාකරු විසින් ඉදිරි වසරේ නිෂ්පාදන ඉලක්ක සේවකයින්ට දැනුම් දීම සඳහා නිකුත් කළ ලිපිය බාහිර සන්නිවේදන ක්‍රමයකි.

(ඊ) බැංකු ජංගම ගිණුම් හිමියකු විසින් නිශ්චිත මුදලක් නම සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන්නාට ගෙවන ලෙස ඔහුගේ බැංකුවට කරන ලිඛිත නියෝගය චෙක්පත වේ. (ලකුණු 02 යි)

(iv) නව ගබඩාව විවෘත කිරීමේ උත්සවයට සහභාගි වන ලෙස ආරාධනා කිරීමේ ආරාධනා පත්‍ර කළමනාකරණ අධ්‍යක්ෂ විසින් ව්‍යාපාරයේ සියලු ම සේවකයින්ට යවන ලදී.

(අ) ඉහත සන්නිවේදන ක්‍රියාවලියට අදාළ යවන්නා, පණිවුඩය, මාධ්‍යය හා ලබන්නා පිළිවෙළින් ලියන්න.

(ආ) ව්‍යාපාරයක් විසින් ගබඩාවක් පවත්වාගෙන යාමෙන් ලබන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(v) සුරංග, බණ්ඩාරවෙළින් නැවුම් මල් තොග වශයෙන් මිල දී ගෙන කොළඹ මල් සාප්පුවලට බෙදා හැරීමේ ව්‍යාපාරයක නිරත වේ.

(අ) මෙම ව්‍යාපාරය සඳහා සුරංග විසින් යොදා ගත යුතු වඩාත් සුදුසු ප්‍රවාහන මාර්ගය හා මාධ්‍යය පිළිවෙළින් ලියන්න.

(ආ) ඉහත (අ) හි එම මාර්ගය හා මාධ්‍යය තෝරා ගැනීමේ දී ඔබ විසින් සලකා බැලූ කරුණු **දෙකක්** ලියන්න.(ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

4. (i) ඉඩමක් මිල දී ගැනීමෙන් ආයෝජකයකුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සාමාන්‍ය කොටස් හා වරණීය කොටස් අතර පවතින සමානකමක් හා අසමානකමක් සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයකට මූල්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න.(ලකුණු 02 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) සී/ස සමාගමක් මූල්‍ය සම්පාදනය කරන එක ම මාර්ගය කොටස් නිකුත් කිරීම වේ.

(ආ) පොලී ආදායම් ලැබීම කොටස්වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභයකි.

(ඉ) ස්ථාවර තැන්පතුවල ප්‍රතිලාභයට වඩා සාමාන්‍ය කොටස්වලින් ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන්නේ ස්ථාවර තැන්පතුවලට වඩා සාමාන්‍ය කොටස්වල ඉහළ අවදානමක් පවතින නිසා ය.

(ඊ) ආයෝජන එහි භෞතික ස්වභාවය පදනම් කර ගෙන විධිමත් හා අවිධිමත් ලෙස වර්ග කෙරේ. (ලකුණු 02 යි)

/හත්වැනි පිටුව බලන්න.

(iv) සම්පත් විසින් මාස දොළහකින් පසුව ගෙවිය යුතු වන රු. 100 000 ක පාඨමාලා ගාස්තුව ඔහුගේ ඥාතියකු විසින් ඔහුට ලබා දී ඇත. පාඨමාලා ගාස්තුව ගෙවීමට අවශ්‍ය වන දිනය තෙක් එම මුදල වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආයෝජන මාර්ගයක යෙදවීමට සම්පත්ට අවශ්‍ය ව ඇත. ඔහුගේ මිතුරෙකු එම මුදල ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරන ලෙස උපදෙස් දී ඇත.

(අ) මෙම මුදල ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම සම්පත්ට වඩාත් ම සුදුසු ආයෝජන මාර්ගය ලෙස ඔබ සිතන්නේ ද?

(ආ) ඉහත (අ) හි ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ලකුණු 02 යි)

(v) 'ප්‍රනාන්දු සහ පුත්‍රයෝ ලී බඩු වෙළෙන්දෝ' ව්‍යාපාරය, ලක්මල් විසින් පවත්වාගෙන යනු ලබන 'ලකී වඩු කර්මාන්තශාලාව' මිල දී ගැනීමට තීරණය කර ඇත.

(අ) 'ප්‍රනාන්දු සහ පුත්‍රයෝ ලී බඩු වෙළෙන්දෝ' සහ 'ලකී වඩු කර්මාන්තශාලාව' කුමන ව්‍යාපාර සංවිධානවලට අයත් ද?

(ආ) ප්‍රනාන්දු සහ පුත්‍රයෝ ලී බඩු වෙළෙඳුන්ට මෙම ආයෝජනය සඳහා මුදල් සම්පාදනය කරගත හැකි මාර්ගයක් ලියන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 10 යි)

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| | වත්කම | = | අයිතිකරුගේ හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් + 50 000 | = | ප්‍රාග්ධනය + 50 000 | | – |
| (ආ) | මුදල් – 20 000<br>බඩු තොගය + 20 000 | = | – | | – |
| (ඇ) | මුදල් – 5 000 | = | විදුලිය ගාස්තු – 5 000 | | – |
| (ඈ) | බඩු තොගය + 10 000 | = | – | | ණයහිමියෝ + 10 000 |
| (ඉ) | මුදල් – 5 000 | = | – | | ණයහිමියෝ – 5 000 |

**අවශ්‍ය වන්නේ:**

ඉහත එක් එක් අවස්ථාවල දී සිදු වූ ගනුදෙනුව අගයයන් සහිත ව ලියන්න. (ලකුණු 05 යි)

(ii) 2014.01.01 දින සජානි විසින් ආරම්භ කරන ලද වෙළෙඳ ව්‍යාපාරයේ 2014.01.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|
| | ගැනුම් | 55 000 | |
| A - | විකුණුම් | | 70 000 |
| | ලී බඩු හා උපකරණ | 42 000 | |
| B - | ගැනිලි | 7 000 | |
| | වැටුප් හා වේතන | 8 000 | |
| | බැංකු ණය | | 25 000 |
| | ගොඩනැගිලි කුලී | 6 000 | |
| | ගෙන ඒමේ කුලී | 10 000 | |
| C - | බැංකු ණය පොලිය | 2 500 | |
| D - | මුදල් ශේෂය | 63 400 | |
| | ප්‍රාග්ධනය | | 100 000 |
| | අවිනිශ්චිත ගිණුම | 1 100 | |
| | | 195 000 | 195 000 |

ඉහත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් පසුව පහත සඳහන් ගිණුම්කරණ වැරදි අනාවරණය විය.

* ලී බඩු උපකරණ අලුත්වැඩියා වියදම වූ රු. 2 000 ලී බඩු ගිණුමට හර කර ඇත.
* ගෙවූ මාසික දුරකථන ගාස්තුව වූ රු. 1 100 මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත ශේෂ පිරික්සුමේ **A, B, C** හා **D** ලෙස නම් කර ඇති එක් එක් ගිණුම අයත්වන ගිණුම් වර්ගය ලියන්න.

(ආ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් ලියන්න.

(ඉ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

/අටවැනි පිටුව බලන්න.

6. (i) (අ) බැංකු ප්‍රකාශනයක හර තීරුවේ දැක්වෙන අයිතම **දෙකක්** ලියන්න.
(ආ) බැංකු ප්‍රකාශනයක බැර තීරුවේ දැක්වෙන අයිතම **දෙකක්** ලියන්න.
(ඉ) මුදල් පොතේ හර පැත්තේ බැංකු තීරුවේ දැක්වෙන අයිතම **දෙකක්** ලියන්න. (ලකුණු 03 යි)

(ii) රුවන් විසින් 2014.01.01 දින ආරම්භ කරන ලද වෙළෙඳ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

* ජනවාරි 1 : රු. 50 000 ක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම.
* ජනවාරි 3 : රු. 30 000 ක බඩු තොගයක් කසුන්ගෙන් ණයට ගැනීම.
* ජනවාරි 4 : කඩකුලී රු. 5 000 ක් මුදලින් ගෙවීම.
* ජනවාරි 5 : අත්පිට විකුණුම් රු. 15 000 යි.
* ජනවාරි 6 : නමාරාට ණයට විකුණුම් රු. 12 000 යි.
* ජනවාරි 7 : විවිධ වියදම් රු. 6 000 ක් මුදලින් ගෙවීම.

**අවශ්‍ය වන්නේ:**
ඉහත ගනුදෙනු ව්‍යාපාරයේ මුදල් පොතේ සටහන් කර, 2014.01.07 දිනට මුදල් පොතේ ශේෂය දක්වන්න. (ලකුණු 03 යි)

(iii) 'ශිල්ප' පාඨක සමාජයේ සාමාජික සංඛ්‍යාව 220 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩාගාරික විසින් පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | රු. |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් | 20 000 |
| විදුලි ගාස්තුව | 3 600 |
| පරණ පත්තර විකිණීමෙන් ලද මුදල | 2 000 |
| ජල බිල්පත් ගාස්තු | 1 200 |
| වේතන | 10 000 |
| පාඨක දඩ ගාස්තු | 500 |
| පුවත්පත් මිල දී ගැනීම් | 6 000 |
| පරිත්‍යාග ලැබීම් | 10 000 |
| ලී බඩු හා උපකරණ මිලට ගැනීම් | 8 000 |

**අවශ්‍ය වන්නේ:**
2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 'ශිල්ප' පාඨක සමාජයේ ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 10 යි)

7. බන්දුගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2013.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 400 000 |
| ආරම්භක තොගය (2013.01.01 දිනට) | 25 000 | |
| ඉඩම හා ගොඩනැගිලි (පිරිවැයට) | 300 000 | |
| යන්ත්‍ර (පිරිවැයට) | 100 000 | |
| ණයගැතියෝ | 42 000 | |
| ණයහිමියෝ | | 35 000 |
| ගැනුම් | 250 000 | |
| විකුණුම් | | 350 000 |
| විදුලි ගාස්තු | 18 500 | |
| රක්ෂණ ගාස්තු | 8 000 | |
| වේතන | 30 000 | |
| ගැනිලි | 5 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 5 000 | |
| බෙදාහැරීමේ වියදම් | 14 500 | |
| 10% බැංකු ණය | | 50 000 |
| බැංකු ගාස්තු | 2 000 | |
| බැංකු ණය පොලී | 2 500 | |
| මුදල් ශේෂය | 32 500 | |
| | 835 000 | 835 000 |

අමතර තොරතුරු :

* 2013.12.31 දිනට තොගයේ පිරිවැය රු. 28 000 කි.
* යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
* ණයගැතියන්ගෙන් රු. 2 000 ක් බොල්ණය ලෙස කපාහැරිය යුතු ය.

**අවශ්‍ය වන්නේ:**
(i) බන්දුගේ ව්‍යාපාරයේ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුම (ලකුණු 05 යි)
(ii) 2013.12.31 දිනට ශේෂ පත්‍රය (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

* * *